# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024

### 2026 ජූලි / අගෝස්තු

### සමාජීය විද්‍යා පීඨය

## ආර්ථිකවිද්‍යාව

### මහා බ්‍රිතාන්‍යයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය - ECON 18224

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

### පළමු කොටස - මහා බ්‍රිතාන්‍යයේ ආර්ථික ඉතිහාසය

01. මහා බ්‍රිතාන්‍යයේ බණ්ඩාරගම් ක්‍රමයේ ලක්ෂණ පැහැදිලි කර එය බිඳ වැටීමට බලපෑ හේතු සහ බිඳවැටීමේදී ඇතිවූ ප්‍රතිවිපාක පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

02. "පළමුවන සහ දෙවන ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාර බ්‍රිතාන්‍ය ආර්ථික ඉතිහාසය තුළ විවිධ අවධිවල පැනනැගුණු ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සෙවීම සඳහා බිහිවූ ව්‍යාපාර වෙයි." විවේචනාත්මකව විමසන්න. (ලකුණු 20)

03. බ්‍රිතාන්‍යය තුළ ඇතිවූ ප්‍රවාහන දියුණුව එරට ආර්ථික සංවර්ධනයට දායක වූ ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. "කාර්මික විප්ලවය මුලින්ම එංගලන්තයේ ඇතිවීමට බලපෑ හේතු වූයේ එරට කලක් තිස්සේ විවිධ අංශවලින් අත්කරගෙන තිබූ දියුණුවේ ප්‍රතිඵලයන්ය" මෙම කියමන සාකච්ඡා කර කාර්මික විප්ලවයේ සමාජ ආර්ථික ප්‍රතිඵල අගයන්න. (ලකුණු 20)

### දෙවන කොටස - ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

05. ශ්‍රී ලංකාවේ රාජකාරි ක්‍රමය පැහැදිලි කර එය බිඳ වැටීමට හේතු සහ එයින් ඇතිවූ ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් වීම නිසා දේශීය යැපුම් කෘෂිකර්මාන්තයට වූ දායකත්වය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 20)

07. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකමය සහ පරිපාලනමය වශයෙන් ඇතිකරන ලද වෙනස්වීම්වල බලපෑම පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 20)

08. ශ්‍රී ලංකාවේ වතු වැවිලි වගාව මගින් ආර්ථික සංවර්ධනයට වූ දායකත්වය විමසන්න. (ලකුණු 20)

*********************************